# (ආ) විදේශීය වෙළෙඳාම*

**පොදු ලක්ෂණ**

ලංකාවේ විදේශීය වෙළෙඳාම සම්බන්ධ මූළු සංඛ්‍යා තොරතුරු II ආ–1 වැනි සංඛ්‍යා සටහනෙන් දැක්වේ.

සංඛ්‍යා සටහන II–ආ–1

## විදේශීය වෙළෙඳාම, 1959–1962

| කාලච්ඡේදය | රුපියල් දශ ලක්ෂ | | | ආනයනවල තුබු අපනයන අනුපාත යෙහි සියයට ගණන |
|---|---|---|---|---|
| | අපනයන (නැ.වි.ස.) | ආනයන (මි.ර.ගැ.) | වෙළෙඳ ශේෂය | |
| 1959 .. .. | 1,754 | 2,005 | —251 | 87 |
| 1960 .. .. | 1,832 | 1,960 | —128 | 93 |
| 1961 .. .. | 1,733 | 1,703 | + 30 | 102 |
| 1962 .. .. | 1,808 | 1,660 | +148 | 109 |

සංඛ්‍යා—ලංකා රේගු වාර්තා වලිනි.

ප්‍රති–අපනයන ඇතුළුව

1962 පිටරට පැටවූ භාණ්ඩවල වටිනාකම රුපියල් කෝටි 180·8 ක් වූ අතර මෙරටට ගෙන්වන ලද භාණ්ඩ වල වටිනාකම රුපියල් කෝටි 166·0 ක් වී ඇත. මේ අනුව පිටරට පැට වූ භාණ්ඩවල වටිනාකම පසුගිය වසරට වඩා සියයට 4·3 කින් වැඩිවී ඇති අතර, මෙරටට ගෙන්වූ භාණ්ඩවල වටිනාකම සියයට 2·5 කින් අඩුවී ඇත. පසුගිය වසරේ රුපියල් කෝටි 3 ක සුළු අතිරික්තයක් ඇතිවූ වෙළෙඳ ශේෂය ද 1962 දී සැලකිය යුතු ලෙස රුපියල් කෝටි 14·8 තෙක් වැඩි විය. ආනයනවලට, අපනයනවල ඇති අනුපාතයද සියයට 102 සිට 109 තෙක් දියුණු විය.

අපනයන වලින් ලද ආදයම වැඩිවීමට මුළුමනින්ම හේතු වූයේ අපනයන පරිමාව වැඩි වීමය. පසුගිය වර්ෂයේ 107 ක්ව තුබූ මහ බැංකු අපනයන දර්ශකය, 1962 දී 115 තෙක් ඉහළ ගියේය. එහෙත් 1962 දී අපනයන මිල සාමාන්‍යය මඳක් අඩුවූයේ, 1961 දී 95 ක්ව තිබූ බැංකු මිල දර්ශකය 1962 දී 93 තෙක් පහළ වැටීණි. මේ අනුව 1961 දී ඇරැඹුන මිල පහළ වැටීම දිගටම පැවැති බව පෙනේ. පසුගිය වසරේ මට්ටමට වඩා අංශක 9 කින් අඩු වුවද මිල පහළ වැටීම 1961 පහළ වැටීම තරම් සීඝ්‍ර වූයේ නොවේ.

අපනයන සැකසුම, II ආ–2 වැනි සංඛ්‍යා සටහනේ දැක්වේ.

සංඛ්‍යා සටහන II ආ–2

## අපනයන සැකසුම

| භාණ්ඩ | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | | මුළු අපනයන වලින් සියයට ගණන | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1959 | 1960 | 1961 | 1962 |
| තේ .. .. .. .. | 1046 | 1096 | 1115 | 1149 | 59·6 | 59·8 | 64·3 | 63·6 |
| රබර් .. .. .. .. | 298 | 378 | 260 | 290 | 17·0 | 20·7 | 15·0 | 16·0 |
| ප්‍රධාන පොල් නිෂ්පාදිත තුන .. .. | 244 | 184 | 202 | 227 | 13·9 | 10·0 | 11·7 | 12·6 |
| අනෙකුත් දේශීය අපනයන .. .. | 104 | 117 | 104 | 100 | 6·0 | 6·4 | 6·0 | 5·5 |
| මුළු දේශීය අපනයන .. .. | 1692 | 1775 | 1681 | 1766 | 96·5 | 96·9 | 97·0 | 97·7 |
| ප්‍රති අපනයන .. .. .. | 62 | 57 | 52 | 42 | 3·5 | 3·1 | 3·0 | 2·3 |
| එකතුව .. .. | 1754 | 1832 | 1733 | 1808 | 100·0 | 100·0 | 100·0 | 100·0 |

සංඛ්‍යා—ලංකා රේගු වාර්තා වලිනි.

*වෙනත් ලෙස සඳහන් කොට නොමැති විට මේ කොටසේ එන සංඛ්‍යා තොරතුරු පදනම් වී ඇත්තේ ලංකා රේගු වාර්තා උඩය.

ප්‍රධාන අපනයන භාණ්ඩ තුන් වර්ගයම, අපනයන ආදයම වැඩි කිරීමෙහි ලා සැලකිය යුතු ලෙස උපකාරී විය. තේ වලින් ලද ආදයම රුපියල් කෝටි 3·4 කින් වැඩි විය. පසුගිය වසර වලදී මෙන්ම, මෙයට ප්‍රධාන හේතුව වූයේ පිටරට පැටවූ ප්‍රමාණය වැඩිවීමය. 1962 රට පැටවූ තේ ප්‍රමාණය රාත්තල් කෝටි 2·6 කින් (සියයට 6 කින්) වැඩි වී ඇත. 1956 සිටම පැවැත එන ලක්ෂණයට අනුව සියලුම වර්ගවලටම අයත් තේ වල නැ.වි.ස. මිල සාමාන්‍යය 1962 දී තව දුරටත් අඩුවූයේ, රාත්තල රුපියල් 2·54 තෙක් පහළ වැටිණි. මෙය පසුගිය වසරේ පැවැති මිලට වඩා රාත්තලක් ශත 8 කින් අඩු වීමෙකි. 1958 න් පසු ඇති වූ බරපතලම අඩුවීම මේ විය.

රබර් වලින් ලද ආදයම, රුපියල් කෝටි 3·0 කින් වැඩි විය. මෙයට මුළුමනින්ම හේතු වූයේ පිටරට පැටවූ රබර් ප්‍රමාණය, රාත්තල් කෝටි 2·7 කින් (සියයට 13·7 කින්) වැඩිවීමය. එහෙත් පසුගිය වසර හා සසඳන විට, රබර් රාත්තලක නැ.වි.ස. මිල සාමාන්‍යය සත 3 කින් අඩු වී ඇත.

ප්‍රධාන පොල් නිෂ්පාදිත තුනෙන් ලද ආදයම, රුපියල් කෝටි 2·5 කින් වැඩි විය. පිටරට පටවන ලද ප්‍රමාණය සියයට 12 කින් වැඩිවීම මෙයට බෙහෙවින් හේතු විය. (මහ බැංකු පරිමා දර්ශකය මෙතෙක් ලැබී ඇති ඉහළම මට්ටමට 154 සිට 173 තෙක් ඉහළ ගියේය). පසුගිය වසර හා සසඳන විට, පොල් නිෂ්පාදිතවල මිල සාමාන්‍යය සියයට $2\frac{1}{2}$ කින් වැඩිවී ඇත. මේ නිෂ්පාදිත පිළිබඳ මහ බැංකු මිල දර්ශකය 80 සිට 82 තෙක් ඉහළ ගියේය.

පිටරටින් ගෙන්වන භාණ්ඩ සීමා කිරීම ද, බඩු ගෙන්වීම සීමා කොට බලපත්‍ර නිකුත් කිරීම පුළුල් කිරීම ද, ජූලි සහ අගෝස්තු වලදී භාණ්ඩ බොහෝවක් සඳහා තීරුබදු වැඩිකිරීම ද, තවත් දැඩි කිරීම් වශයෙන්, මේ වසරේ ජූලි, සැප්තැම්බර් සහ ඔක්තෝබර් යන මාසවල විධිවිධාන පැනෙව්වද, පසුගිය වසර හා සසඳා බලන විට, 1962 මෙරටට ගෙන්වන ලද භාණ්ඩවල මුළු වටිනාකම අඩුවී ඇත්තේ (රුපියල් කෝටි 4·3 කින්) ඉතා සුළු වශයෙනි. මහබැංකුවේ ආනයන පරිමා දර්ශකයට අනුව, මෙරටට ගෙන්වන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය සියයට 1·1 කින් වැඩිවී ඇත. බැංකු දර්ශකය එකකින් 92 ට වැඩි වී ඇත. ප්‍රධාන ආනයන ගණ සඳහා වූ ඒ දර්ශක, අනුව ආයෝජන භාණ්ඩ සහ අන්තර් භාණ්ඩ, සියයට 13·7 කින් හා සියයට 11·0 කින් වැඩි වී ඇති අතර, පාරිභෝගික භාණ්ඩ ප්‍රමාණය සියයට 6·0 කින් අඩුවී ඇති බව හෙළි වෙයි. ''පාරිභෝගික'' භාණ්ඩ ගණයෙහි ඉතාමත් වේගයෙන් පහළ වැටී ඇත්තේ ''අනෙකුත් පාරිභෝගික භාණ්ඩ'' ගණයයි. මෙය සියයට ·82 කින් අඩුවී ඇති අතර, ''ආහාරපාන'' සියයට 6·2 කින්ද, ''රෙදිපිළි'' සියයට 1·3 කින් ද, අඩු වී ඇත.

ගෙන්වන ලද ප්‍රමාණය වැඩි වුවද, මිල ප්‍රමාණය සියයට 5·9 කින් අඩුවීම නිසා මෙය බෙහෙවින්ම මැකී ගියේය. පසුගිය වසරේ 101 ක් වූ මෙහි බැංකු මිල දර්ශකය, 95 තෙක් අඩුවිය. ප්‍රධාන ආනයන වර්ග තුනෙහිම මිල අඩුවීමෙක් සටහන් වී ඇත. වැඩියෙන්ම මිල අඩුවී ඇත්තේ, ආයෝජන භාණ්ඩවලය. මේ සඳහා වූ දර්ශකය 112 සිට 92 (සියයට 17·9) තෙක් අඩුවිය. අන්තර් භාණ්ඩ සියයට 4·5 කින් සහ පාරිභෝගික භාණ්ඩ සියයට 2·0 කින් මඳ වශයෙන් අඩු විය. පාරිභෝගික භාණ්ඩ ගණයෙහි මිල බෙහෙවින්ම පහළ වැටී ඇත්තේ රෙදිපිළිවලය. මෙය සියයට 6·3 කින් අඩුවූ අතර, ''ආහාර පාන'' සහ ''අනෙකුත් පාරිභෝගික භාණ්ඩ'' ගණ සියයට 1·0 කින්, හා සියයට 4·2 කින් අඩුවිය.

අපනයන සහ ආනයන මිල දර්ශකයන් සියයට 2·1 කින් හා සියයට 5·9 කින් පමණ අඩු වීම නිසා, වෙළෙඳ අනුපාත දර්ශකය 98 ක් වීමෙන් සියයට 4·3 ක පමණ දියුණුවක් පෙන්වීය.

විදේශීය වෙළෙඳාම සම්බන්ධ වූ සංඛ්‍යා II පරිශිෂ්ටයේ 32 සිට 36 තෙක් සංඛ්‍යා සටහන් වල දී ඇත.

අපනයන
තේ

II ආ–3 වැනි සංඛ්‍යා සටහනින් තේ නිෂ්පාදනය අපනයනය, සහ මිල ගණන් දැක්වේ.

සංඛ්‍යා සටහන II ආ–3

## තේ නිෂ්පාදනය, අපනයනය සහ මිල

| වර්ෂය | නිෂ්පාදනය | අපනයනය | | කොළඹ වෙන්දේසියේ රාත්තලක මිල සාමාන්‍යය | | | |
|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රාත්තල් දශලක්ෂ | ප්‍රමාණය රාත්තල් දශලක්ෂ | රාත්තලක නැ. වි. ස. මිල රු. සත | උස් බිම් වගාව රු. සත | මැදි බිම් වගාව රු. සත | පහත් බිම් වගාව රු. සත | සියලුම තේ වර්ග රු. සත |
| 1955 .. .. | 380 | 362 | 3·30 | 2·34 | 2·04 | 2·40 | 2·24 |
| 1956 .. .. | 376 | 348 | 3·00 | 2·50 | 1·96 | 1·88 | 2·16 |
| 1957 .. .. | 398 | 368 | 2·78 | 2·05 | 1·61 | 1·88 | 1·86 |
| 1958 .. .. | 413 | 411 | 2·75 | 2·11 | 1·51 | 1·48 | 1·73 |
| 1959 .. .. | 413 | 384 | 2·72 | 2·13 | 1·69 | 1·67 | 1·85 |
| 1960 .. .. | 435 | 410 | 2·67 | 2·03 | 1·75 | 1·83 | 1·88 |
| 1961 .. .. | 455 | 426 | 2·62 | 1·99 | 1·72 | 1·74 | 1·83 |
| 1962 .. .. | 467 | 452 | 2·54 | 2·02 | 1·61 | 1·56 | 1·75 |

සංඛ්‍යා—ලංකා රේගු වාර්තා, කොළඹ තේ බ්‍රෝකර් වරුන්ගේ සංගමය, තේ පාලක ගේ පාලන වාර්තාව.

1962 තේ නිෂ්පාදනය රාත්තල් කෝටි 1·2 කින් හෙවත් සියයට 2·6 කින් වැඩි විය. මෙය පසුගිය දෙවසර තුළ ඇති වූ වැඩි වීමේ වේගයට වඩා අඩුය. පිටරට පැටවූ ප්‍රමාණය මෙයට වඩා වේගයකින් වැඩි විය. එහෙත් මිල සතුටුදායක නොවීය. කොළඹ වෙන්දේසි පොළේ හැම වර්ගය කම තේ මිල පසුගිය අවුරුද්දට වඩා වැඩි වේගයකින් සත 8 කින් (සියයට 4·4 කින්) පහළ වැටිණි. සෑහෙන ප්‍රමාණයකින්, මිල වැඩිවූ, අවුරුද්දේ අවසාන කාර්තුවේ දී හැර, අනෙක් හැම කාර්තුවකදීම ලැබුණ මිල පසුගිය වසරේ එම කාර්තුවලදී ලැබුණ මිලට වඩා අඩු විය. එහෙත් තේ වර්ග තුනේ මිල හැඩගැසුන අන්දම ඒකාකාර නොවීය. උස් බිම් වගාවේ තේ මිල සාමාන්‍යය වසර තුළ දී මඳ වශයෙන් සත 03 කින් (සියයට 1·5) දියුණු විය. මාර්තු මාසයේදී ඉතා ඉහළ මට්ටමකට නැඟුණ තේ මිල, ජූනි මාසයේදී වේගයෙන් පහළ වැටිණි. නැවත ඊළඟ කාර්තුවෙහි තේ, තත්ත්වයෙන් උසස් වීමත් සමග, සැප්තැම්බර් මාසයේදී තේ මිල හොඳ අතට හැරුනද, එය අවුරුද්දේ අවසාන කොටසේ දී නැවත අඩුවී ගියේය. මැදි බිම් වගාවේ තේ මිල සාමාන්‍යය, වසර තුළදී සත 11 කින් (සියයට 6·4 කින්) අඩු වූ අතර, පහත් බිම් වගාවේ තේ මෙයටත් වැඩියෙන්, සත 18 කින් (සියයට 10·3 කින්) පහළ වැටිණි. මේ තේ දෙවර්ගයේ මිල, අවුරුද්දේ වැඩි කාලයක් තුළ අඩුවෙමින් තිබිණි. මෙසේ මිල පහළ වැටීමට තුඩුදුන් එක් හේතුවක් වූයේ ඉන්දීය තේ කිලෝග්‍රෑමයක අපනයන බද්ද නයා පයිස 44 සිට 25 තෙක්, 1962 අප්‍රේල් මාසයේදී අඩු කිරීමය. මේ නිසා ලංකාවේ හොඳම තේවල හැර අනෙක් හැම තේ වර්ගයකම මිල අඩුවිය. අනෙක් කරුණ වූයේ සමහර මැද පෙරදිග, රටවල එනම් අයිරානයේ තේ වෙළෙඳාම අන්‍යොන්‍ය වෙළෙඳාම් ක්‍රමය උඩ පුළුල් කර ගැනීමට අපහසු වීමය. එහෙත් අවසාන කාර්තුවේදී, මිලෙහි තාවකාලික දියුණුවක් ඇති විය. මෙයට හේතු වූයේ බ්‍රහ්ම පුත්‍රා ගඟෙහි, වැඩ කළ පකිස්තානි, නාවිකයන් වැඩ වර්ජනය කිරීමෙන් හා චීන–ඉන්දීය දේශ සීමා අරගලය නිසා ඇතිවුන නොසන්සුන් තත්ත්වය නිසා උතුරු ඉන්දීය තේ කල්කටාවට, සිරිත් පරිදි ගෙන ඊමට බැරිවීමය.

චීන–ඉන්දීය ආරාවුල නිසා ලෝකයේ හැම තේ වෙළෙඳ පොළකම මිල අවුරුද්ද අවසාන හරියේදී වැඩිවන අතට හැරිණි. ලංඩන් වෙන්දේසියේ සාමාන්‍ය වර්ගයේ තේ සඳහා ඉල්ලීම අධික වූ අතර, එහි මිල සීඝ්‍රයෙන් වැඩිවිය. මධ්‍ය වර්ගයේ තේ සඳහා වූ ඉල්ලුම, හොඳ වුවද මිල ඉහළයාම එතරම් වැඩි නොවීය. එහෙත් මේ හේතූන් හොඳ වර්ගයේ තේ මිල කෙරෙහි එතරම් බලපෑවේ නොවේ. මේ වෙන්දේසි වල දී ලංකා තේ වලට ලැබුන මිල සාමාන්‍යය. අවුරුද්දේ ඊට පසු මාසවල ලැබුන මිල සාමාන්‍යයට ද වඩා අඩුවිය. මෙය පුදුම එලවන්නක් මෙන් සැලකිය හැකිය.

1962 දී ලංකාවේ සහ අප්‍රිකාවේ තේ නිෂ්පාදනය වැඩි වී ඇති අතර, උතුරු ඉන්දියාවේ තේ නිෂ්පාදනය සැහෙන ලෙස අඩුවී ඇති බව ලැබී ඇති තාවකාලික සංඛ්‍යා වලින් හෙළිවෙයි. එක්සත් රාජධානියට ගෙන්වන ලද මුළු තේ ප්‍රමාණය පසුගිය අවුරුද්දේදීට වඩා (රාත්තල් විසි ලක්ෂයකින් පමණ)* මඳක් වැඩිවිය. මේ නිෂ්පාදනයෙන් 1963 වසරට ගෙන යාමට ලොකු ඉතිරියක් ඇතිවිය නොහේ. ලංකාවේ තේ කර්මාන්තය ගැන සලකා බලන විට හොඳ මිලක් ලැබීමේ ප්‍රධානතම සාධකය වී ඇත්තේ තේ වල තත්ත්වයයි.

### රබර්

රබර් නිෂ්පාදනය, අපනයනය සහ මිල ගණන් II ආ–4 වැනි සංඛ්‍යා සටහනින් දැක්වේ.

සංඛ්‍යා සටහන II ආ–4

**රබර් නිෂ්පාදනය, අපනයනය සහ මිල**

| වර්ෂය | නිෂ්පාදනය රාත්තල් දශලක්ෂ | අපනයන රාත්තල් දශලක්ෂ | රාත්තලක නැ. වි. ස. මිල | ආර්. එස්. එස්. නො. 1 කොළඹ වෙළෙඳ මිල රාත්තලකට මිල රු. |
|---|---|---|---|---|
| 1955 .. .. | 210 | 222 | 1·58 | 1·28 |
| 1956 .. .. | 214 | 193 | 1·52 | 1·45 |
| 1957 .. .. | 220 | 209 | 1·44 | 1·16 |
| 1958 .. .. | 224 | 207 | 1·25 | 0·93 |
| 1959 .. .. | 205 | 206 | 1·45 | 1·25 |
| 1960 .. .. | 218 | 235 | 1·61 | 1·24 |
| 1961 .. .. | 215 | 197 | 1·32 | 1·01 |
| 1962 .. .. | 229 | 224 | 1·29 | 0·98 |

සංඛ්‍යා—රබර් පාලක තැනගේ පරිපාලන වාර්තා, ලංකා රේගු වාර්තා සහ කොළඹ රබර් වෙළෙඳ සංගමයේ වාර්තා වලිනි.

1961 දී රාත්තල් තිස් ලක්ෂයකින් (සියයට 1·4 කින්) පහළ වැටුන රබර් නිෂ්පාදනය 1962 දී රාත්තල් කෝටි 1·4 කින් (සියයට 6·5 කින්) වැඩි විය. පසු ගිය අවුරුද්දේ මෙන් නොව පිටරට පැටවූ රබර් ප්‍රමාණය ද වේගයෙන් වැඩි විය. ආර්. එස්. එස්. නො. 1 මිල සාමාන්‍යය පසු ගිය වසරට වඩා සත 3 කින් (සියයට 3 කින්) අඩු වීමෙන් 1950 ට පසු වැටුන පහළම මට්ටමට වැටිණි. ජාත්‍යන්තර දේශපාලන තත්ත්වය අනුව සහ එක්සත් ජනපදයේ රබර් තොග මුදහැරීමේ කතාබහ අනුව, රබර් වෙළෙඳ පොළ විටින් විට අවස්ථානුරූපව වෙනස් වුවද, අවුරුද්දේ වැඩි කොටසක ජාත්‍යන්තර රබර් වෙළෙඳ පොළ උදාසීන ගතියක් ඉසිලීය. අවුරුද්දේ මුල් කාලයේදී මිල සැහෙන අන්දමින් දියුණු විය. බටහිර නිව්ගිනියාව නිසා ලන්දේසීන් සහ ඉන්දුනීසියානුන් අතර ඇතිවූ නොසන්සුන් කමත්, රුසියාව විසින් වැඩි වශයෙන් රබර් මිලදී ගැනීමත් මේ මිල වැඩිවීමට උපකාරී විය. ඊට පසු ක්‍රමයෙන් අඩු වන්නට වූ රබර් මිල, ජූනි මාසය වන විට 1958 පසු ඇති වූ අඩුම මිලට වැටිණි. එක්සත් ජනපදයේ කොටස් වෙළෙඳ පොළෙහි ඇතිවූ පරිහානිය සහ ලාඕසය උඩ ඇතිවූ නොසන්සුන් ගතිය නිවී යාමත්, රබර් තොග මුද හැරීම සම්බන්ධයෙන් පැවැති අනියත බවත්, කෘත්‍රිම රබර් නිසා වැඩිවෙමින් පවත්නා තරඟකාරී ගතියත්, මේ තත්ත්වය උදා කර ලීමට ඉවහල් වූ සාධක විය. කියුබානු අර්බුදයට සහ චීන ඉන්දීය අරගලයට පින්සිදු වන්නට නැවතත් අවසාන කාර්තුවේ දී රබර් මිලෙහි සැහෙන දියුණුවක් ඇති විය. මේ දියුණුව අර්බුද වලින් නැගුණ උණුසුම නිවී යාමෙන් පසුව ද පැවැතිණි.

ස්වාභාවික රබර් කර්මාන්තයට මුහුණ පෑමට සිදුවන ලොකුම බාධකය වී ඇත්තේ, කෘත්‍රිම රබර් නිසා ඉදිරි අවුරුදු වලදී ඇති වන තියුණු තරඟයයි. විවිධාකාරයෙන් නිපදවෙන කෘත්‍රිම රබර් නිසා, මෙතෙක් මුළුමනින්ම ස්වභාවික රබර් වැඩට ගත් බොහෝ අංශ පටු වෙමින් යන හැටි දක්ක හැකිය. ඉදිරි අවුරුදු වල දී මුළු රබර් ඉල්ලුමෙන් මේ නිෂ්පාදන දෙක අතර බෙදී යන කොටසේ ප්‍රමාණය බොහෝ සෙයින්ම තීරණය කැරෙන එක් සාධකයක් වන්නේ තරඟයයි. තරඟය කෙරෙහි බලපාන ප්‍රධාන සාධකය, මිල විය යුතු අතර, බඩුවල පිරිසිදුකම හා

*1963 පෙබරවාරි 1 වැනි දින දරන ලන්ඩන්හි තේ බ්‍රෝකර් වරුන්ගේ සංගමයේ තේ වෙළෙඳ වාර්තාවේ දැක්වෙන පරිදි

ඒකාකාරබව, ඇහිරීම හා ඉදිරිපත් කිරීම ද, ඒ කෙරෙහි බලපාන වැදගත් සාධකයෝ වෙති. මේ සාධක අනුව බලන විට ස්වභාවික රබර් කෘත්‍රිම රබර් වලට පරදින බව, ලැබී ඇති සාක්ෂි වලින් හෙළි වෙයි. ජාත්‍යන්තර රබර් හැදෑරුම් මුළුවේ ඇස්තමේන්තු අනුව 1962 දී ලෝකයේ කෘත්‍රිම රබර් ටොන් 22,25,000 ක් ද, ස්වාභාවික රබර් ටොන් 21,10,000 ක් ද නිපදවා ඇත. මේ අනුව නිපදවා ඇති කෘත්‍රිම රබර් ප්‍රමාණය ස්වාභාවික රබර් ප්‍රමාණයට වඩා මඳක් වැඩිය. ලෝකයේ පාවිච්චියට ගත් කෘත්‍රිම රබර් ප්‍රමාණය ටොන් 21,38,000 ක් වීමෙන්, පාවිච්චියට ගත් ස්වාභාවික රබර් ටොන් 21,90,000 ට වඩා මඳක් අඩුවී ඇත. 1963 දී ලෝකයේ කෘත්‍රිම රබර් නිෂ්පාදනය සහ ප්‍රයෝජනයට ගැනීම ස්වාභාවික රබර් වලට වඩා වැඩි විය හැකි බව, මූලික ඇස්තමේන්තු අනුව හෙළි වේ. 1962 වසර හා සසඳන විට ප්‍රයෝජනයට ගනු ලැබෙන ස්වාභාවික රබර් ප්‍රමාණය මඳක් අඩු විය හැකි යයි බලාපොරොත්තු වෙයි.*

**පොල් නිෂ්පාදිත**

ප්‍රධාන පොල් නිෂ්පාදිත වල අපනයනය, සහ මිල ගණන් II ආ–5 වැනි සංඛ්‍යා සටහනින් දැක්වේ.

### සංඛ්‍යා සටහන II ආ–5

## ප්‍රධාන පොල් නිෂ්පාදිත - අපනයන, පරිමාව සහ මිල

| වර්ෂය | කොප්පරා | | පොල්තෙල් | | කපාපු පොල් | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය හොණ්ඩර දහස් ගණනින් | හොණ්ඩරයක නැ. වි. ස. මිල රු. | ප්‍රමාණය හොණ්ඩර දහස් ගණනින් | හොණ්ඩරයක නැ. වි. ස. මිල රු. | ප්‍රමාණය හොණ්ඩර දහස් ගණනින් | හොණ්ඩරයක නැ. වි. ස. මිල රු. |
| 1955 .. | 1,367 | 41·90 | 1,945 | 58·26 | 1,157 | 47·36 |
| 1956 .. | 1,155 | 42·43 | 1,698 | 58·42 | 1,275 | 50·86 |
| 1957 .. | 695 | 47·95 | 1,081 | 62·80 | 978 | 56·08 |
| 1958 .. | 554 | 52·97 | 887 | 69·80 | 1,135 | 63·72 |
| 1959 .. | 852 | 60·52 | 1,389 | 84·41 | 1,050 | 71·45 |
| 1960 .. | 583 | 55·23 | 1,110 | 71·83 | 1,099 | 65·23 |
| 1961 .. | 1,100 | 43·47 | 1,837 | 58·16 | 967 | 49·23 |
| 1962 .. | 1,448 | 40·74 | 2,043 | 54·97 | 981 | 57·23 |

සංඛ්‍යා—ලංකා රේගු වාර්තා වලිනි.

1961 දී සියයට 88·7 කින් වැඩි වූ පිටරට පැටවූ කොප්පරා ප්‍රමාණය 1962 දී තවදුරටත් සියයට 31·6 කින් වැඩිවිය. එසේම, සියයට 65·5 කින් වැඩි වූ පොල් තෙල් ප්‍රමාණය සියයට 11·2 කින් වැඩි වී ඇත. මේ අනුව, 1961 ඇති වූ හැඩ ගැස්ම එලෙසම තුබුනද, වැඩිවීමේ වේගය 1962 දී සැලෙන ප්‍රමාණයකින් අඩු වී ඇති බව හෙළි වෙයි. පසුගිය වසරේ දී වේගයෙන් පහළ වැටුන, පිටරට පැටවූ කපාපු පොල් ප්‍රමාණය, 1962 දී හොණ්ඩර 14,000කින් (සියයට 1·4 කින්) සුළු වශයෙන් වැඩිවිය. අවුරුද්දේ මුල්කොටසේදී කොප්පරා මිල සතුටුදයක ලෙස වැඩිවුවද, අවුරුද්දේ මැදභාගය වනවිට මිල නරක අතට හැරෙන්නට විය. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ඉන්දියාවට කොප්පරා ගෙන්වන බලපත්‍ර සීමා කිරීමත්, කොප්පරා සඳහා ඉන්දියාවේ තීරු බදු වැඩි කිරීම සහ මාසා දියට අනුව පොල් පලදාව වැඩිවීමත්ය. එහෙත් පොල් නිෂ්පාදනය කරන රටවල එලදාව අඩු වෙතැයි යන බලාපොරොත්තුව නිසාත්, ලෝක වෙළෙඳ පොළේ පොල් තෙල් සැපැයුම අඩු වීම නිසාත්, අවසාන කාර්තුව තුළ දී මිල යථා තත්ත්වයට පැමිණියේය. පසුගිය වසරේ පැවැති මිල සාමාන්‍යය හා සසඳන විට 1962 කොප්පරා වල නැ. වි. ස. මිල සාමාන්‍යය සියයට 6·3 කින් අඩු වී ඇත. පොල් තෙල් මිල ද, සාමාන්‍ය වශයෙන් කොප්පරා මිල අනුව ගියේ, චීනය සහ එ.ස.සෝ. ස. මෙරට වෙළෙඳ පොළින් පොල් තෙල් ගැනීම නිසා වසර තුළ විටින් විට මිල වැඩි විය. පොල් තෙල්වල නැ.වි.ස. මිල සාමාන්‍යය අවුරුද්ද තුළ සියයට 5·5 කින් අඩු විය. එහෙත් 1961 දී පරිහානි මට්ටමකට වැටී තුබුණ කපාපු පොල් මිල වේගයෙන් යථා තත්ත්වයට පැමිණියේය. මේ භාණ්ඩ නිෂ්පාදනයේදී, සෞඛ්‍යාරක්ෂණ විධිවිධාන තදින්ම අනුගමනය කිරීමට රජය විසින් සහ කර්මාන්ත හිමියන් විසින් ගත් උත්සාහය මෙයට හේතුවක් විය. කපාපු පොල් වල නැ. වි. ස. මිල සාමාන්‍යය 1961 පැවැති ප්‍රමාණයට වඩා සියයට 16·3 කින් පමණ වැඩි විය.

*ස්වාභාවික රබර් පුවත්—1962 දෙසැම්බර් මාසය 1 වැනි පිටුව.

පොල් තෙල් ඇතුළු වෘක්ෂලතා ගණයට වැටෙන තෙල් වර්ගවල මිල 1962 දී පොදුවේ පහළ වැටීමට ප්‍රධාන හේතුන් වූයේ 1960/61 දී සහ 1961/62 දී ලෝකයේ මේද සහ තෙල් නිෂ්පාදනය වේගයෙන් වැඩිවීමත්, එම කාලයේදී අපනයන අවශ්‍යතා දියුණු නොවීමත්ය. මෑත වර්ෂවල දී ඇති වූ තවත් අවාසියක් වූයේ ලෝක වෙළෙඳ පොළේ, විශේෂයෙන් කාර්මික අතින් දියුණු රටවල මේද සහ තෙල්, වෙනුවට මාලු තෙල්, බටර්, ඌරු තෙල් හා ගව තෙල් වැඩි වැඩියෙන් පාවිච්චියට ගැනීමය. මේ තෙල් වර්ග වෙළෙඳාම සඳහා සමහර කාර්මික රටවල සහනාධාර ද ලැබෙන්නේ ය.

**ආනයන**

තෝරා ගත් ආනයන ප්‍රධාන වර්ග අනුව සහ භාණ්ඩ හෝ භාණ්ඩ ගණ අනුව හෝ වර්ග කොට II ආ–6 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

**සංඛ්‍යා සටහන II ආ–6**

## තෝරා ගත් ආනයන—ප්‍රධාන ගණ වශයෙන් 1959—1962

| භාණ්ඩ | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | | මුළු ආනයනවල සියයට ගණන | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1959 | 1960 | 1961 | 1962 |
| **1. පාරිභෝගික භාණ්ඩ** | | | | | | | | |
| **(අ) ආහාර පාන** | | | | | | | | |
| (i) සහල් .. .. .. | 283 | 242 | 217 | 195 | 14·1 | 12·3 | 12·7 | 11·7 |
| (ii) පිටි .. .. .. | 106 | 65 | 70 | 71 | 5·3 | 3·3 | 4·1 | 4·3 |
| (iii) සීනි .. .. .. | 75 | 79 | 78 | 58 | 3·7 | 4·0 | 4·6 | 3·5 |
| (iv) කිරි සහ කිරි නිෂ්පාදිත .. | 76 | 70 | 65 | 74 | 3·8 | 3·6 | 3·8 | 4·5 |
| (v) මස්, මාළු සහ බිත්තර .. .. | 94 | 111 | 72 | 56 | 4·7 | 5·7 | 4·2 | 3·4 |
| (vi) කඩල, ඇටවර්ග සහ කුළුබඩු .. | 92 | 102 | 104 | 111 | 4·6 | 5·2 | 6·1 | 6·7 |
| (vii) අනෙකුත් ආහාර .. .. | 60 | 70 | 56 | 60 | 3·0 | 3·6 | 3·3 | 3·6 |
| (viii) බීම සහ සකස් කළ දුම්කොළ .. | 14 | 14 | 9 | 5 | 0·7 | 0·7 | 0·5 | 0·3 |
| **(ආ) රෙදි පිළි** (උදා: කැටි නූල් හා නූල් හැර අනෙකුත් සියලුම රෙදිපිළි) .. | 189 | 207 | 183 | 161 | 9·4 | 10·6 | 10·7 | 9·7 |
| **(ඇ) අනෙකුත් පාරිභෝගික භාණ්ඩ** | | | | | | | | |
| (i) මෝටර්කාර් .. .. .. | 50 | 53 | 8 | 2 | 2·5 | 2·7 | 0·5 | 0·1 |
| (ii) ඔරලෝසු .. .. .. | 16 | 29 | — | — | 0·8 | 1·5 | — | — |
| (iii) සම්පූර්ණ රේඩියෝ රිසීවර .. | 10 | 12 | 3 | 1 | 0·5 | 0·6 | 0·2 | 0·1 |
| (iv) රබර් ටයර් සහ ටියුබ් .. .. | 25 | 20 | 21 | 24 | 1·2 | 1·0 | 1·2 | 1·4 |
| (v) ඖෂධ හා ඖෂධීය සංයෝග .. | 32 | 32 | 27 | 25 | 1·6 | 1·6 | 1·6 | 1·5 |
| **2. අන්තර් භාණ්ඩ** | | | | | | | | |
| (i) පොහොර වර්ග .. .. | 61 | 58 | 57 | 60 | 3·0 | 2·9 | 3·3 | 3·6 |
| (ii) පැට්‍රල් නිෂ්පාදිත .. .. | 132 | 118 | 126 | 125 | 6·6 | 6·0 | 7·4 | 7·5 |
| (iii) ගල් අඟුරු .. .. .. | 11 | 17 | 9 | 9 | 0·5 | 0·9 | 0·5 | 0·5 |
| (iv) සකස් නොකළ දුම්කොළ .. | 11 | 11 | 13 | 10 | 0·5 | 0·6 | 0·8 | 0·6 |
| (v) කැටි නූල් සහ නූල් .. .. | 21 | 25 | 23 | 22 | 1·0 | 1·3 | 1·4 | 1·3 |
| (vi) කඩදාසි හා කඩදාසි බෝඩ් .. | 34 | 39 | 33 | 32 | 1·7 | 2·0 | 1·9 | 1·9 |
| (vii) රසායනික ද්‍රව්‍ය හා සංයෝග .. | 13 | 15 | 15 | 16 | 0·6 | 0·8 | 0·9 | 1·0 |
| (viii) ඩයිවර්ග, ඔප දමන ද්‍රව්‍ය හා පාටවර්ග | 13 | 12 | 11 | 15 | 0·6 | 0·6 | 0·6 | 0·9 |
| **3. ආයෝජන භාණ්ඩ** | | | | | | | | |
| (i) ගොඩනැගිලි උපකරණ.. .. | 72 | 80 | 71 | 78 | 3·6 | 4·1 | 4·2 | 4·7 |
| (ii) ගමනාගමන උපකරණ .. | 36 | 25 | 23 | 16 | 1·7 | 1·3 | 1·4 | 1·0 |
| (iii) යන්ත්‍රෝපකරණ .. .. | 30 | 25 | 21 | 17 | 1·5 | 1·3 | 1·2 | 1·0 |
| **4. ඉහත ශීර්ෂවල එකතුව** .. | 1,556 | 1,531 | 1,315 | 1,243 | 77·6 | 78·1 | 77·2 | 74·9 |
| **5. අනෙකුත් ආනයන** .. | 449 | 429 | 388 | 417 | 22·4 | 21·9 | 22·8 | 25·1 |
| **6. සියළුම ආනයනවල එකතුව** .. | 2,005 | 1,960 | 1,703 | 1,660 | 100·0 | 100·0 | 100·0 | 100·0 |

සංඛ්‍යා—රේගු වාර්තාවලිනි.

1962 දී මෙරටට ගෙන්වන ලද මුළු භාණ්ඩ ප්‍රමාණයෙහි වටිනාකම, පසුගිය අවුරුද්දට වඩා රුපියල් කෝටි 4·3 කින් හෙවත් සියයට 2·5 කින් අඩුවිය. ''පාරිභෝගික භාණ්ඩ'' වර්ගයේ ''ආහාරපාන ගණයේ'' රජයෙන් ගෙන්වනු ලබන, පරිමා සීමාවනට යටත් නොවූ, මුළු ආනයන වලින් රු. කෝටි 32·4 ක් (සියයට 19·5 ක්) වන හාල්, පිටි සහ සීනි ගෙන්වීම රුපියල් කෝටි 4·1 කින් හෙවත් සියයට 11·2 කින් අඩුවිය. මේ භාණ්ඩ ආනයනයේ ඇතිවූ වෙනස්කම්, පහළ සංඛ්‍යාවලින් පැහැදිලි වෙයි.

ප්‍රමාණය (ප්‍ර) = ටොන් දහසින්
වටිනාකම (ව) = රුපියල් දශ ලක්ෂ
මිල, මි.ගැ. (මි) = රු. /ටොන් එකකට

| | | 1961 | 1962 | නියම වෙනස | වෙනස සියයට |
|---|---|---|---|---|---|
| හාල්— | ප්‍ර | 462 | 404 | — 58 | —12·6 |
| | ව | 217 | 195 | — 22 | —10·1 |
| | මි | 470·80 | 482·60 | + 11·80 | + 2·5 |
| පිටි— | ප්‍ර | 171 | 173 | + 2 | + 1·2 |
| | ව | 70 | 71 | + 1 | + 1·4 |
| | මි | 407·80 | 413·00 | + 5·20 | + 1·3 |
| සීනි— | ප්‍ර | 200 | 168 | — 32 | —16·0 |
| | ව | 78 | 58 | — 20 | —25·6 |
| | මි | 387·40 | 346·20 | — 41·20 | —10·6 |

සංඛ්‍යා—ලංකා රේගු වාර්තාවලිනි.

මේ ගණයේ අනෙකුත් භාණ්ඩ අතරින්, මස්, මාලු, හා බිත්තර ද ''බීම හා සාදන ලද දුම් කොළ ද,'' රුපියල් කෝටි 1·6 කින් (සියයට 22·2 කින්) හා රු. කෝටි 0·4 කින් (සියයට 44·4 කින්) අඩු වූ අතර කිරි හා කිරි නිෂ්පාදිත සැලකිය යුතු ලෙස රු. කෝටි 0·9 කින් (සියයට 13·8 කින්) වැඩි විය. මුළු ආනයන වලින් තවමත් සැහෙන ප්‍රමාණයක් වන රෙදිපිළි ගෙන්වීම, නූල් හැර රු. කෝටි 2·2 කින් (සියයට 12 කින්) අඩුවිය. ''අනෙකුත් පාරිභෝගික භාණ්ඩ'' ගණයෙහි ඉතාමත් දැඩි ආනයන සීමා කිරීම් වලට භාජන වූ මෝටර් කාර් සහ ගුවන්විදුලි රිසීවර ගෙන්වීම 1961 පැවැති අඩු මට්ටමින් තවත් අඩුවිය. රබර් ටයර් සහ ටියුබ් ගෙන්වීම, 1962 ජූලි 26 වැනි දින පෞද්ගලික බලපත්‍ර යටතට ගනු ලැබුවද, රු. කෝටි 0·3 කින් (සියයට 14·3 කින්) වැඩි විය. අන්තර් භාණ්ඩ'' ගණයෙහි සායම් පෙවීමට, වර්ණ යෙදීමට, හා පාට කිරීමට, ගනු ලබන ද්‍රව්‍ය ගෙන්වීම රු. කෝටි 0·4 කින් (සියයට 36·4 කින්) වේගයෙන් වැඩි විය. එහෙත්, නොසැදූ දුම්කොළ ගෙන්වීම රු. කෝටි 0·3 කින් (සියයට 23·1 කින්) අඩු විය. තව දුරටත් විවට පොදු බලපත් යටතේ, නිදහසේ ගෙන්වනු ලබන පොහොර, ඛනිජ තෙල් නිෂ්පාදිත, සහ රට අඟුරු ගෙන්වූ ප්‍රමාණය පසුගිය වසර හා සසඳන විට, එතරම් වෙනසකට ලක් වී නොමැත. ආයෝජන භාණ්ඩ ගණයෙහි ''ගමනා ගමන උපකරණ'' රු. කෝටි 0·7 කින් (සියයට 30·4 කින් ද) ''යන්ත්‍රෝපකරණ'' රු. කෝටි 0·4 කින් (සියයට 19·0 කින්ද) වේගයෙන් අඩුවිය. එහෙත් ''ගොඩනැගිලි උපකරණ'' රු. කෝටි 0·7 කින් (සියයට 9·9 කින්) වැඩි විය. ''අනෙකුත් ආනයන'' ගණයට ඉතිරිවන අනියමිත භාණ්ඩ ගෙන්වීම රු. කෝටි 2·9 කින් (සියයට 7·5 කින්) වැඩි විය.

**වෙළෙඳාම පැවැති ආකාරය**

වෙළෙඳාම පැවැති ආකාරය, ප්‍රධාන ප්‍රදේශ හා මුදල් කලාප වශයෙන් වෙන්කොට 11 පරිශිෂ්ටයේ 36 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

1962 දී ද මුළු වෙළෙඳාමෙන් (ආනයන හා අපනයන) භාගයකටත් වඩා කැරුනේ රන්පවුම් කලාපය සමගය. 1962 මුළු අපනයන වලින් සියයට 55·7 ක් ද, මුළු ආනයන වලින් සියයට 54·5 ක් ද, රන්පවුම් කලාපය අතර ගනුදෙනු විය. මේ කලාපයට යවන ලද භාණ්ඩවල වටිනාකම, රුපියල් කෝටි 98·38 ක් වීමෙන් රුපියල් කෝටි 2·66 කින් වැඩි වී ඇති අතර, කලාපයෙන් ගෙන්වූ භාණ්ඩවල වටිනාකම

රුපියල් කෝටි 90·51 ක් වීමෙන් රුපියල් කෝටි 5·07 කින් අඩු විය. මේ කලාපය සමග පැවැති වෙළෙඳ ශේෂය, රුපියල් කෝටි 7·87 ක අතිරික්තයක් පෙන් වී ය. මෙය පසුගිය වසරට වඩා රුපියල් කෝටි 7·73 ක වැඩි වීමෙකි. ඩොලර් කලාපයට යැවුන භාණ්ඩවල වටිනාකම, රුපියල් කෝටි 23·79 ක් වීමෙන් රුපියල් කෝටි 0·98 කින් අඩු වී ඇත. පොල්තෙල් අපනයනය රුපියල් කෝටියකින් අඩු විය. මේ කලාපයෙන් ගෙන්වන ලද භාණ්ඩවල වටිනාකම රුපියල් කෝටි 4·81 කින් රුපියල් කෝටි 6·20 තෙක් සීග්‍රයෙන් අඩුවී ගියේ ය. මෙයට හේතුවූයේ ප්‍රධාන වශයෙන්ම කියුබාවෙන් ගෙන්වන ලද සීනි ප්‍රමාණය රුපියල් කෝටි 3·13 කින් අඩුවීමය. මේ කලාපය සමග වෙළෙඳාමේ දී පුන-පුනාම ඇතිවන වෙළෙඳ අතිරික්තය, රුපියල් කෝටි 17·59 තෙක් වැඩි වීය. මෙය පසුගිය වසරට වඩා රුපියල් කෝටි 3·83 කින් වැඩිවීමෙකි.

ලංකාවේ අපනයන වලින් පොදු රාජ්‍යය ම ණ්ඩලයට යැවුන කොටසෙහි වටිනාකම, රුපියල් කෝටි 94·07 ක් විය. මෙය 1961 වසරේදීට වඩා මුදලින් රුපියල් කෝටි 2·24 ක වැඩිවීමෙකි. එහෙත් මුළු අපනයනවල අනුපාතිකයක් වශයෙන් සලකන විට, පසුගිය වසරේ සියයට 54·6 ක් වුවද, මේ වසරේ දී සියයට 53·3 තෙක් අඩුවී ඇත. පොදු රාජ්‍ය මණ්ඩලයෙන් ගෙන්වන ලද භාණ්ඩවල වටිනාකම ද 1962 දී රුපියල් කෝටි 6·16 කින්, රුපියල් කෝටි 71·86 තෙක් අඩු විය. මුළු අපනයනවලට එහි වූ සියයට ගණනද, සියයට 2·5 කින් සියයට 43·3 තෙක්අඩු විය. පොදුරාජ්‍ය මණ්ඩලය සමග, පැවැති වෙළෙඳාමෙන් ලංකාවට රුපියල් කෝටි 22·21 ක වාසි සහගත වෙළෙඳ ශේෂයක් විය. මෙය පසුගිය වසරේදීට වඩා රුපියල් කෝටි 8·4කින් වැඩිවීමෙකි.

''යුරෝපීය ආර්ථික ප්‍රජාවට'' යවන ලද භාණ්ඩ වල වටිනාකම රුපියල් කෝටි 0·78 කින්, රුපියල් කෝටි 15·48 තෙක් වැඩි විය. මෙයට ප්‍රධාන හේතුව වූයේ, යැවුන පොල් තෙල් වල වටිනාකම, රුපියල් කෝටි 0·61 කින්, රුපියල් කෝටි 2·72 තෙක් වැඩිවීමය. මුළු අපනයනවලින් ආර්ථික ප්‍රජාවට යැවුන කොටස සියයට 8·8 ක් විය. පසුගිය වසර හා සසඳන විට, මෙහි සිදු වී ඇත්තේ සුළු වෙනසෙකි. ආර්ථික ප්‍රජාවෙන්, මෙරටට ගෙන්වන ලද භාණ්ඩ වල වටිනාකම, රුපියල් කෝටි 17·49 ක් විය. මෙය රුපියල් කෝටි 0·41 කින් අඩුවීමෙකි. ආර්ථික ප්‍රජාවේ ආනයන, මුළු ආනයන වලින් සියයට 10·5 ක් වූ අතර, පසුගිය වසර හා සසඳන විට, මෙහි වෙනසෙක් ඇතිවී නැත. ආර්ථික ප්‍රජාව සමග පැවැති අවාසි සහගත වෙළෙඳ ශේෂය රුපියල් කෝටි 1·19 කින් රුපියල් කෝටි 2·01 තෙක් වීමෙන්, වැඩි අතට හැරිණි. යුරෝපීය නිදහස් වෙළෙඳ සංගමයට යැවුන භාණ්ඩ ප්‍රමාණය, රුපියල් කෝටි 54·46 ක් විය. මෙය පසුගිය වසරට වඩා රුපියල් කෝටි 3·71 කින් වැඩිවීමෙකි. මේ රටවලින් ගෙන්වූ භාණ්ඩ, රුපියල් කෝටියකින් රුපියල් කෝටි 39·16 තෙක් අඩුවිය. වෙළෙඳ ශේෂය රුපියල් කෝටි 15·3 ක අතිරික්තයක් පෙන්විය. මෙය කෝටි 4·71 කින් දියුණු වීමෙකි.

ආසියාවේ හා ඈත පෙරදිග ආර්ථික කොමිසමට අයත් රටවලට යැවුන භාණ්ඩවල වටිනාකම, රුපියල් කෝටි 6·39 කින් රුපියල් කෝටි 29·39 තෙක් වැඩි විය. මුළු අපනයන වලින් මෙය සියයට 16·6 ක් විය. පසුගිය වසරට වඩා සියයට 3 ක වැඩිවීමෙකි. මේ පෙදෙසට යැවුන මුළු භාණ්ඩවලින්, පෙදෙසේ ප්‍රධාන ගැනුම් කරුවන් වන චීනය, සියයට 45·3 ක් ද, ඉන්දියාව සියයට 21·5 ක් ද, ජපානය සියයට 12·0ක්ද ගෙන ඇත. මේ පෙදෙසින් ගෙන්වන ලද භාණ්ඩවල වටිනාකම රුපියල් කෝටි 72·35 ක් විය. මෙය පසුගිය වසරට වඩා රුපියල් කෝටි 0·91 කින් අඩුවීමෙකි. මුළු ආනයන වලින් මේ පෙදෙසෙන් ගෙන්වූ කොටස සියයට 43·6 ක් වී ඇත. පසුගිය වසර හා සසඳන විට මෙහි සිදුවී ඇත්තේ සුළු වෙනසෙකි. මේ පෙදෙසේ අපට භාණ්ඩ සපයන ප්‍රධාන රටවල් තුන වන බුරුමය, ජපානය, සහ ඉන්දියාව, මේ පෙදෙසෙන් ආ මුළු භාණ්ඩ ප්‍රමාණයෙන් සියයට 26·1 ක් ද, 25·1 ක් ද, 22·5 ක් ද පිළිවෙළින් සපයා ඇත. ලංකාව මුදල් කලාප හා පෙදෙස් සමග කැරුන වෙළෙඳාමෙන් විශාලම අවාසි වෙළෙඳ ශේෂය ඇතිවූයේ මේ පෙදෙස් සමග කැරුන වෙළෙඳාමෙනි. 1962 දී මේ ශේෂය රුපියල් කෝටි 42·96 ක් විය. මෙය පසුගිය වසරට වඩා රුපියල් කෝටි 7·3 කින් දියුණු වී ඇත.

පසුගිය වසර හා සසඳන විට, 1962 දී චීනය සමග පැවැති වෙළෙඳාම සැහෙන ප්‍රමාණයකින් දියුණු වී ඇත. අපනයන වටිනාකම රුපියල් කෝටි 5 කින් වැඩි වූ අතර ආනයන වටිනාකම රුපියල් කෝටි 0·6 කින් වැඩි විය. අපනයන වටිනාකම වැඩිවීමට ප්‍රධානතම හේතුව වූයේ රබර්

අපනයනය රුපියල් කෝටි 5·6 කින් වැඩිවීමය. කොප්පරා අපනයනය රුපියල් කෝටි 0·7 කින් අඩු වුවද, පොල් තෙල් අපනයනය පසුගිය වසරට වඩා මඳක් වැඩි විය. චීනය සමග ඇතිවූ වෙළෙඳ අතිරික්තය, රුපියල් කෝටි 9·2 ක් විය. මෙය පසුගිය වසරට වඩා රුපියල් කෝටි 4·4 කින් වැඩිවීමෙකි.

චීනය සමග පැවැති වෙළෙඳ හා ගෙවීම් ගිවිසුමේ විධිවිධානවලට අනුව, වසර තුළ දෙරට අතර වෙළෙඳාමේ පදනම වශයෙන් 1962 දී අත්සන් කැරුන ගිවිසුම් ලේඛනයට අනුව, ලංකාවෙන් රබර් මෙට්රික් ටොන් 31,000 ක් චීනයට විකිණීමට ද, චීනයෙන් හාල් මෙට්රික් ටොන් 2,00,000 මිලයට ගැනීමට ද නියමිතව තිබිණි.

චීන ලංකා වෙළෙඳ ගනුදෙනු සංඛ්‍යා තොරතුරු II ආ–7 සංඛ්‍යා සටහනේ දැක්වේ.

සංඛ්‍යා සටහන II ආ–7

## චීන ලංකා වෙළෙඳ ගනුදෙනු

| වර්ෂය | අපනයන | | ආනයන* | | වෙළෙඳ ශේෂය රු. දශලක්ෂ |
|---|---|---|---|---|---|
| | වටිනාකම (රු. දශලක්ෂ) | මුළු දේශීය අපනයනයෙහි සියයට ගණන | වටිනාකම රු. දශලක්ෂ | මුළු ආනයනයේ සියයට ගණන | |
| 1956 .. .. | 182 | 11·0 | 134 | 8·2 | +48 |
| 1957 .. .. | 167 | 10·5 | 84 | 4·6 | +83 |
| 1958 .. .. | 78 | 4·7 | 152 | 8·8 | —74 |
| 1959 .. .. | 78 | 4·6 | 150 | 7·5 | —72 |
| 1960 .. .. | 121 | 6·6 | 132 | 6·8 | —12 |
| 1961 .. .. | 83 | 4·9 | 35 | 2·0 | +48 |
| 1962 .. .. | 133 | 7·5 | 41 | 2·5 | +92 |

සංඛ්‍යා—රේගු වාර්තාවලිනි.

*චීනය සමග වූ වෙළෙඳ හා ගෙවීම් ගිවිසුම යටතේ සපයන ලද බුරුම හාල් හැර

එක්සත් සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව සහ අනෙකුත් නැගෙනහිර යුරෝපයේ රටවල් සමග පැවැති වෙළෙඳාම පසුගිය වසරට වඩා 1962 දී දියුණු විය. අපනයන රුපියල් කෝටි 0·87 කින් වැඩිවූ අතර, ආනයන රුපියල් කෝටි 3·85 කින් වැඩි විය. මේ පෙදෙස සමග වූ වෙළෙඳ ශේෂයෙහි රුපියල් කෝටි 0·32 ක හිඟයක් ඇතිවිය. මේ 1958 න් පසු ඇති වූ ප්‍රථම හිඟය විය.

ලංකාව මේ පෙදෙස සමග කැරුන වෙළෙඳාම පිළිබඳ සංඛ්‍යා තොරතුරු II ආ–8 සංඛ්‍යා සටහනින් දැක්වේ.

සංඛ්‍යා සටහන II ආ–8

## එ.ස.සෝ.ස. සහ නැගෙනහිර යුරෝපය* සමග වෙළෙඳාම

| වර්ෂය | අපනයන | | ආනයන | | වෙළඳ ශෙෂය (රු. දශලක්ෂ) |
|---|---|---|---|---|---|
| | වටිනාකම රු. දශලක්ෂ | මුළු අපනයනයෙහි සියයට ගණන | වටිනාකම (රු. දශලක්ෂ) | මුළු ආනයනයෙහි වටිනාකම | |
| 1956 .. .. | 1·3 | 0·08 | 8·0 | 0·49 | — 6·7 |
| 1957 .. .. | 6·5 | 0·41 | 10·6 | 0·59 | — 4·1 |
| 1958 .. .. | 24·7 | 1·49 | 9·2 | 0·54 | +15·5 |
| 1959 .. .. | 28·4 | 1·68 | 23·8 | 1·19 | + 4·6 |
| 1960 .. .. | 58·1 | 3·27 | 21·8 | 1·11 | +36·3 |
| 1961 .. .. | 78·4 | 4·67 | 51·8 | 3·04 | +26·6 |
| 1962 .. .. | 87·1 | 4·93 | 90·3 | 5·44 | — 3·2 |

සංඛ්‍යා : රේගු වාර්තාවලිනි.

*බල්ගේරියාව, චෙකොස්ලොවැකියාව, නැගෙනහිර ජර්මනිය, හන්ගේරියාව, පෝලන්තය, රුමේනියාව සහ යුගොස්ලෝවියාව.

මේ පෙදෙසේ ලංකාවේ භාණ්ඩ ප්‍රධාන. වශයෙන් ගනු ලැබුයේ එක්සත් සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව සහ පෝලන්තයයි. මේ පෙදෙසට යැවුන මුළු භාණ්ඩ වලින්, රුපියල් කෝටි 3·65 ක (සියයට 41·9) භාණ්ඩ එ.ස.සෝ.ස.ට යැවුන අතර පෝලන්තයට රුපියල් කෝටි 3·2 ක (සියයට 36·7) ක භාණ්ඩ යැවිණි. එහෙත් පසුගිය වසර හා සසඳන විට, එ.ස.සෝ. ස.ට යැවූ භාණ්ඩවල වටිනාකම රුපියල් කෝටි 0·86 කින් අඩුවී ඇත. මේ රටට යැවුන රබර්වල වටිනාකම, රුපියල් කෝටි 3·54 කින් අඩුවිය. එහෙත් යැවුන තේ වල වටිනාකම රුපියල් දශ ලක්ෂයේ සිට රුපියල් කෝටි 1·94 තෙක් වැඩි විය. පෝලන්තයට යැවුන ප්‍රධාන භාණ්ඩය වූයේ රබර් ය. මෙය රුපියල් කෝටි 1·35 කින් වැඩි විය.

මේ පෙදෙසේ, ලංකාවට භාණ්ඩ සපයන ප්‍රධාන රටවල් වූයේත් පෝලන්තය සහ එ.ස.සො.ස වයි. මේ පෙදෙසින් ගෙන්වූ මුළු භාණ්ඩ වලින් රුපියල් කෝටි 3·4 ක භාණ්ඩ (සියයට 37·7) සෝවියට් සමූහාණ්ඩුවෙන් සැපයුන අතර, රුපියල් කෝටි 2·73 (සියයට 30·2) වටිනා භාණ්ඩ සැපැයුනේ පෝලන්තයෙනි. චෙකෝස්ලෝවැකියාවෙන් ගෙන්වන ලද භාණ්ඩවල වටිනාකම, රුපියල් කෝටි 1·21 ක් විය. මෙය පසුගිය වසරේ ප්‍රමාණයට ම පැවැතිනැයි කිව හැකිය. සෝවියට් සමූහාණ්ඩුවෙන් ගෙන්වන ලද භාණ්ඩවල වටිනාකම රුපියල් කෝටි 2·45 කින්, වේගයෙන් වැඩි විය. මේ වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ, ප්‍රථම වරට මේ රටෙන් රුපියල් කෝටි 1·46 ක් වටිනා ඛනිජතෙල් නිෂ්පාදිත ගෙන්වීමය. පෝලන්තයෙන් ගෙන්වන ලද භාණ්ඩවල වටිනාකම රුපියල් කෝටි 0·31 කින් වැඩි විය. පසුගිය වසරේ මෙන්ම ප්‍රධාන වශයෙන් ගෙන්වන ලද භාණ්ඩය වූ සීනිවල වටිනාකම, රුපියල් කෝටි 1·89 ක් විය.

චීනය, එ.ස.සො. ස සහ අනෙකුත් නැගෙනහිර යුරෝපීය රටවල් සමග පැවැති ලංකාවේ වෙළෙඳාමට මුදල් සැපයුනේ, එකී රටවල් සමග ගිවිසගෙනැති ගෙවීම් ගිවිසුම්වල විධිවිධාන යටතේ පවත්වාගෙන යන ද්විපාර්ශ්වීය නිශකාෂණ ගිණුම් මාර්ගයෙනි. මේ ගිණුම්වල (ශුද්ධ) එකතුව කාර්තු වශයෙන් ද, එවැනි ම ගෙවීම් ක්‍රම ඇති එක්සත් අරාබි ජනරජය, සිරියාව සහ අයිරානය වෙනුවෙන් ඇති ගිණුම් ද, පහළ සටහනේ දැක්වේ.

සංඛ්‍යා සටහන II ආ–9

**ද්විපාර්ශ්වීය නිශකාෂණ ගිණුම්,**

**1959 - 62 නිශකාෂණ ගිණුම්වල (ශුඩ) එකතුව — කාර්තු වශයෙන්**

රුපියල් දශ ලක්ෂ

| අවසානයට ගිණුම් තතු (ශුද්ධ) | චීනය, එ.ස.සෝ.ස. සහ අනෙකුත් නැගෙනහිර යුරෝපීය රටවල් 1 | | මැද පෙරදිග රටවල් 2 | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | බැර | හර | බැර | හර |
| 1959 මාර්තු .. | 10·3 | | | | 10·3 | |
| ජූනි .. | | 4·5 | | | | 4·5 |
| සැප්තැම්බර් .. | 22·2 | | | | 22·2 | |
| දෙසැම්බර් .. | | 11·7 | | | | 11·7 |
| 1960 මාර්තු .. | | 18·9 | | | | 18·9 |
| ජූනි .. | | 2·6 | | | | 2·6 |
| සැප්තැම්බර් .. | | 13·3 | | | | 13·3 |
| දෙසැම්බර් .. | | 26·5 | | | | 26·5 |
| 1961 මාර්තු .. | | 39·4 | | | | 39·4 |
| ජූනි .. | | 25·5 | | 1·7 | | 27·2 |
| සැප්තැම්බර් .. | 11·8 | | | 1·9 | 9·9 | |
| දෙසැම්බර් .. | 10·6 | | | 5·4 | 5·2 | |
| 1962 මාර්තු .. | | 6·9 | | 7·0 | | 13·9 |
| ජූනි .. | | 42·8 | | 10·7 | | 53·5 |
| සැප්තැම්බර් .. | | 22·3 | | 10·8 | | 33·1 |
| දෙසැම්බර් .. | | 7·3 | | 5·4 | | 12·7 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1 බල්ගේරියාව, චෙකෝස්ලෝවැකියාව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව, හන්ගේරියාව, පෝලන්තය සහ රුමේනියාව

2 එක්සත් අරාබි සමූහාණ්ඩුව, අයිරානය සහ සිරියාව

සැ:යු:— බැර — ලංකාවෙන් අය විය යුතු
හර — ලංකාවට අය විය යුතු

## වෙළෙඳ ප්‍රතිපත්තිය සැකසුන හැටි

### ආනයන පාලනය

ගෙවුම් ශේෂයෙහි දිගටම පැවැති දුෂ්කරතා නිසාත් විදේශීය සංචිත තත්වය අසතුටුදයක් වීම නිසාත්, ආනයන සීමා කිරීමේ විධිවිධාන 1962 දී තවදුරටත් ශක්තිමත් කරනු දක්නට ලැබිණි. අවුරුද්ද මුල දී, පෞද්ගලික ආනයන බලපත්‍ර යටතට ගෙනා ආනයන ප්‍රමාණය 1961 දී කැරුන ආනයන ප්‍රමාණයෙන් සියයට 17 හෙවත් රුපියල් කෝටි 28·7 ක් පමණ විය.

වසර තුළදී පනවන ලද ප්‍රධාන විධිවිධානවල ප්‍රතිඵලයක් වශයෙන් බලපත්‍ර අනුව ආනයන පාලනය කෙතෙක් දුරට බලපා ඇත්තේ ද යනු, පහත එන සංඛ්‍යා සටහනින් පැහැදිලි වෙයි.

සංඛ්‍යා සටහන II ආ 10

**ආනයන පාලනය**

**පෞද්ගලික ආනයන බලපත්‍ර ක්‍රමය බලපා ඇති ප්‍රමාණය (1)–1962**

| | ආනයන | | | | |
|---|---|---|---|---|---|
| | 1961 | | 1962 | | |
| | බලපා ඇති වටිනාකම රු.ද.ල. | මුළු ආනයනවල සියයට ගණන | බලපා ඇති වටිනාකම රු.ද.ල. | මුළු ආනයනවල සියයට ගණන | මුළු වෙනස රු.ද.ල. |
| **1962 ජනවාරි 1** | | | | | |
| වර්ෂයාරම්භයට වූ සීමා කිරීමේ ආසන්න බලපෑම .. .. | **287** | **17** | **205** | **12** | **—82** |
| (අ) අනෙකුත් ශීර්ෂ—රෙදිපිළි හැර .. .. .. | 246 | 14 | 168 | 10 | —78 |
| (ආ) රෙදිපිළි (2) .. .. .. .. .. | 41 | 2 | 37 | 2 | — 4 |
| **1962 පෙබරවාරි 8** | | | | | |
| අංක 4/62–21 දරන ආනයන පාලන නිවේදනය, ඇහුරු පළතුරු කටුකම්බි, මුද්‍රණ කඩදසි, ලියන කඩදසි ප්‍රෙන්ච් පොලිෂ් සහ තුවා ඇතුළු ශීර්ෂ .. .. .. .. .. | 15 | 1 | 11 | 1 | — 4 |
| **1962 ජුලි 26** | | | | | |
| (i) අංක 28/62 දරන ආනයන පාලන නිවේදනය කලින් බල පත්‍ර යටතට නොගත් සෑම වර්ගවලම රෙදිපිළි .. .. | 165 | 10 | 146 | 9 | —19 |
| (ii) අංක 29/62 දරන ආනයන පාලන නිවේදනය, රබර් ටයර් සහ ටියුබ් .. .. .. .. | 21 | 1 | 24 | 1 | + 3 |
| **1962 සැප්තැම්බර් 15** | | | | | |
| අංක 37/62—47 දරන ආනයන පාලන නිවේදනය. බේකරි නිෂ්පාදිත, කේජු, මාජරින් අයිස්ක්‍රීම් කෝන්, පිඟන් ගඩොල්, විදුලි පහන්, වළලු හා පබළු මාල, සිගරට් ලයිටර්ස් හා හඳුන්කූරු .. | 17 | 1 | 21 | 1 | + 4 |
| **1962 ඔක්තෝබර් 10 වැනිදාට පෙර සීමා කිරීමේ මුළු බලපෑම** .. .. .. .. .. | **505** | **30** | **407** | **25** | **—98** |
| **1962 ඔක්තෝබර් 10** | | | | | |
| අංක 44/62 දරන ආනයන පාලක නිවේදනය තවදුරටත් විවට පොදු බලපත්‍ර යටතට ගැනෙන පහත සඳහන් ඒවා හැර, අනෙකුත් සියලුම ආනයන මේ නිවේදනයෙන් පෞද්ගලික බලපත්‍ර පාලනය යටතට ගැනේ. (1) ආහාර ද්‍රව්‍ය (2) පැට්‍රෝල් (3) ඉන්ධන (4) පොහොර හා (5) ලංකාවේ ආරෝග්‍යශාලා න්‍යාය මාලාවෙහි ඇතුළත් ඖෂධ. | | | | | |
| **1962 ඔක්තෝබර් 10 වැනිදට සීමා කිරීමේ මුළු බලපෑම** | 811 | 48 | 807 | 49 | — 4 |

(1) මෙහි බලපෑම නියත වශයෙන්ම කිට්ටුම ගණනට වේ. එයට හේතුව රේගු වාර්තා අනුව සීමා කිරීම සඳහා තෝරා ගනු ලබන ඇතැම් ආනයන ශීර්ෂ (බොහෝවිටම ප්‍රමාණයෙන් ඉතා කුඩා වූ හෝ වෙන් වෙන්ව වර්ග කැරුන) වෙන් වශයෙන් හඳුනාගැනීමට නොහැකිවීමය.

(2) ඒකකයක ආනයන මිල නියමිත මිලකට වැඩි නොවුන රෙදිපිළි ගණයේ ආනයන බොහොමයක් ම පෞද්ගලික බලපත්‍ර යටතට නොගැනිණි.

සියලුම ශීර්ෂ යටතට ගැනෙන ආනයන (ආහාර වර්ග, පැට්‍රෝල්, ඉන්ධන පෝර සහ ඖෂධ යන පස් වර්ගය හැර) පෞද්ගලික බලපත්‍ර පාලනයට ගනු ලැබූ 1962 ඔක්තෝබර් 10 වැනි දිනට පෙරාතුව පනවනු ලැබූ සීමා කිරීම්වලින් ඇතිවූ බලපෑම, 1961 ආනයන වලින් සියයට 30 ක් හෙවත් රුපියල් කෝටි 50·5 කට සමාන විය. 1962 දී ඇතිවූ සමානරූප බලපෑම එම අවුරුද්දේ ආනයන වලින් රුපියල් කෝටි 40·7 හෙවත් සියයට 25 කට සමානය. මේ සීමාකිරීම් වලින් බලපෑමක් ඇතිකළ ආනයන වටිනාකම පසුගිය අවුරුද්දේ දීට වඩා 1962 රුපියල් කෝටි 9·8 කින් අඩු වී ඇත. 1962 ඔක්තෝබර 10 වැනි දින පනවන ලද සීමා කිරීම්වල බලපෑම සීඝ්‍ර යෙන් වැඩි වූයේ, 1961 ආනයන වලින් රුපියල් කෝටි 81·1 ක් හෙවත්, සියයට 48 ක් සහ 1962 මුළු ආනයන වලින් රු. කෝටි 80·7 ක් හෙවත් සියයට 49 කෙරෙහි බලපා ඇත.

1962 ජුලි, සැප්තැම්බර්, ඔක්තෝබර් මාස වලදී පනවන ලද විධිවිධාන හේතුකොට ගෙන අවුරුද්දකට විදේශීය විනිමය රුපියල් කෝටි 10·0 ක් පමණ ඉතිරි වෙතැයි ඇස්තමේන්තු කොට ඇත. මෙහි සම්පූර්ණ බලපෑම නිසැකයෙන්ම ඇතිවන්නේ 1963 දීය. සවිස්තර සංඛ්‍යා තොරතුරු නොමැති නිසා 1962 දී ආනයන පිළිබඳ මෙය කෙතරම් බලපා ඇති ද යනු නිවැරදිව, ඇස්ත මේන්තු කළ හැක්කේ නොවේ. පළමුව පෞද්ගලික බලපත්‍ර යටතට ගෙන ඇති භාණ්ඩ වර්ග වලින්, හැම වර්ගයකින්ම ගෙන්වන ලද ප්‍රමාණය සඳහන් කොට නැත. දෙවැනිව, පරිමා සීමාවන් සඳහා තෝරාගත්තේ කවර ශීර්ෂයන් ද යන වග රේගු සංඛ්‍යා වලින් හඳුනා ගත හැක්කේ ද නොවේ. (බොහෝ විට, ප්‍රමාණය ඉතා අඩුය. නැතහොත් වෙනස්ව වර්ග කොට ඇත). එහෙත් මෙරටට බඩු ගෙන්වන්නන් විසින් සීමා කිරීම් බලාපොරොත්තුවෙන් විශාල බඩු තොග සඳහා ප්‍රථමයෙන් ඇණවුම් කර තිබීම නිසා, සමහර ශීර්ෂ සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීම නිරර්ථක වී ගියා මෙන් විය.

### තීරු බදු

#### අපනයන බදු

පොල් පුනක්කුවල තීරු බද්ද ටොන් එකකට රුපියල් 25/— සිට රුපියල් 75/— තෙක් 1962 ඔක්තෝබර් 18 වැනි දින සිට වැඩි කිරීම හැර, අපනයන නිෂ්පාදිත සඳහා තුබූ බදු සම්බන්ධයෙන් වෙනසෙක් නොකරන ලදී. එහෙත් අවුරුද්දේ අවසාන කොටසේදී කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් සහ ගෙඩි පොල් අපනයනය සඳහා අනුප්‍රමාණ බද්දක් අය කිරීමට රජයේ අවධානය යොමු වෙමින් තිබිණි.[1]

#### ආනයන බදු

1962 ජුලි 26 වැනි දින, අයවැය යෝජනාවලට තෝරාගත් භාණ්ඩ බොහෝ ගණනෙක තීරු බදු වැඩි කිරීමේ යෝජනා ද ඇතුළත් විය. මේ සීමාකිරීම් නිසා 1961 වර්ෂයේ ආනයනවලින් සියයට 8 ක් හෝ රුපියල් කෝටි 14·0 කෙරෙහි හෝ බලපානු ඇතැයි ගණන් බලනු ලැබීය. කිහිප දිනක් බලපැවැත්වූ අලෙවි බද්ද අස්කර ගැනීමත් සමග, 1962 අගෝස්තු මස 3 වැනි දින, මිනිසාගේ ප්‍රයෝජනයට ගනු ලබන ආහාර පාන ද, අන්තරායිදයි පැට්‍රෝල් ද, බූමිතෙල් සහ දළ පැට්‍රෝල් ද, 1962 ජුලි 26 වැනි දින, ප්‍රකාශයට පමුණුවනු ලැබූ වැඩි කිරීම් වලට අසුවූ භාණ්ඩ ද. හැර අනෙකුත් සියලුම ආනයන සඳහා තීරු බද්ද සියයට 20 කින් වැඩි කරන ලදී. මේ වැඩි කිරීම් 1961 ආනයන වලින් සියයට 51 ක් හෙවත් රුපියල් කෝටි 86·3 ක් කෙරෙහි බලපා ඇත. මෙසේ දෙවරක් බදු වැඩි කරනු ලැබුයේ දේශීය මුදල් ප්‍රසාරණය කපා හැරීමෙන් ආනයන සඳහා ඇති ඉල්ලුම ඇතුළු, දේශීය ඉල්ලුම සීමා කිරීමේ එක්තරා ප්‍රතිකාරක ක්‍රියාවක් වශයෙනි.

සංවර්ධන අධ්‍යක්ෂ විසින් ඔහුගේ මතයේ හැටියට දේශීය කර්මාන්තයට අවශ්‍යවන අමු ද්‍රව්‍ය, කාර්මික යන්ත්‍රෝපකරණ සහ උපකරණ, සවි කළ කොටස්, කොටස් සහ අනුකොටස් ගෙන්වීම සඳහා 1962 පෙබරවාරි 7 වැනි දින සියයට 7½ සහනදයක වරණීය බද්දක් ද සියයට 17½ සාමාන්‍ය සහනදයක ආනයන බද්දක් ද, පනවනු ලැබීය.

---

1 1963 ජනවාරි 7 වැනි දින මෙම නිෂ්පාදිත සඳහා අනුප්‍රමාණ බද්දක් පනවන ලදී. මේ අනුව බදු අයකැරෙන්නේ සඳුදයින් ඇරඹෙන සෑම සතියක් සඳහාම ලන්ඩනයේ පොල්තෙල් වල සිංගප්පූරුවේ මි.ර.ගැ. මිල අනුව ප්‍රධාන රේගු අයකැමි විසින් ඇස්තමේන්තු කොට දක්වන, අවම මිල ප්‍රමාණයන් අනුවය.

බදු ප්‍රමාණයන් මෙසේය;—

| සිංගප්පූරු පොල්තෙල් වල ඇස්තමේන්තු කළ ලන්ඩනයේ මි.ර.ගැ. මිල | කොප්පරා ටොන් එක කට බද්ද | පොල්තෙල් ටොන් එක කට බද්ද | කපාපු පොල් ටොන් එක කට බද්ද | ගෙඩි පොල් 1000 කට බද්ද |
|---|---|---|---|---|
| | රු. සත | රු. සත | රු. සත | රු. සත |
| පවුම් 65 කට අඩු නම් .. .. .. | 115·00 | නැත | නැත | 28·75 |
| පවුම් 65 ක් නම් .. .. .. .. | 115·00 | නැත | නැත | 28·75 |
| පවුම් 65 කට වැඩි එහෙත් පවුම් 66 කට නොවැඩි නම් | 117·73 | 4·44 | 3·77 | 29·43 |

ඇස්තමේන්තු මි.ර.ගැ. මිල පවුම් 147 ක් හෝ ඊට වැඩිවේ නම් ගෙවිය යුතු උපරිම බදු ප්‍රමාණයන් පිළිවෙලින් රුපියල් 462·30 ක්, රු. 564·37 ක්, රු. 479·26ක් හා රුපියල් 115·58 ක් වේ.

**වෙළෙඳ ගිවිසුම්**

වසර තුළදී පහත දක්වෙන වෙළෙඳ ගිවිසුම් ගිවිස ගන්නා ලදී.

**1962 ජනවාරි 12 වැනි ද** ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව (නැගෙනහිර ජර්මනිය) සමග වෙළෙඳ ගිවිසුමක් ගිවිස ගන්නා ලදී. මෙය 1963 අප්‍රේල් මස 22 වැනිද තෙක් වලංගු වන අතර, ඊට පසු එක් එක් අවුරුද්දට අළුත් කළ හැකිය. මෙහි අන්‍යොන්‍ය වශයෙන් පවුම් 40,000 ක ''භ්‍රමණ ණයක්'' සඳහා විධිවිධාන සලසා ඇත.

**1962 පෙබරවාරි 16 වැනිද** 1960 දෙසැම්බර් 23 වැනි දින එක්සත් අරාබි ජන රජයත් සමග ගිවිස ගනු ලැබූ ගෙවීම් ගිවිසුමට, ගිවිසුම් ලේඛනයක් ගිවිස ගන්නා ලදී. මෙහි මුල් ගිවිසුමේ සිරියන් පෙදෙස සම්බන්ධ වූ නියමයන් ලොප් කිරීමටත්, එක්සත් අරාබි ජනරජයෙන් ගෙන්වන භාණ්ඩ ලැයිස්තුව සංශෝධනය කිරීමටත් විධිවිධාන සලසා තිබිණි. අන්‍යොන්‍ය වශයෙන් ලැබෙන ''භ්‍රමණ ණය'' ද පවුම් 2,50,000 සිට පවුම් 3,50,000 තෙක් වැඩි කැරිණි.

**1962 පෙබරවාරි 18 වැනිද** අයිරානය සමග වෙළෙඳ සහ ගෙවීම් ගිවිසුමක් ගිවිස ගන්නා ලදී. මේ ගිවිසුමේ විධිවිධාන වලට අනුව, පවුම් 10,00,000 වටිනා තේ ලංකාවෙන් ඉරානයට යැවිය යුතු අතර, පවුම් 5,00,000 වටිනා දුරු වර්ග, ධාන්‍ය ඇට, වියලි පළතුරු සහ ගල්තාර ගෙන්වා ගත යුතුය. ගිවිසුමේ අන්‍යොන්‍ය වශයෙන්, පවුම්, 1,00,000 ක ''භ්‍රමණ ණයකට'' විධිවිධාන සලසා ඇත. ගිවිසුම් දෙකම අනුමැතිය ලැබූ දින සිට වසරකට වලංගුය.

**1962 පෙබරවාරි 22 වැනිද** අන්‍යොන්‍ය වශයෙන් බඩු හුවමාරුව සඳහා එ. ස. සො. ස. සමග ගිවිසුමක් ඇති කර ගන්නා ලදී. මෙය 1962 ජනවාරි පළමු වැනිද සිට බලපවත්වන අතර 1964 තෙක් වලංගු වෙයි. 1958 පෙබරවාරි 8 වැනි දින ගිවිස ගන්නා ලද වෙළෙඳ සහ ගෙවීම් ගිවිසුමේ විධිවිධාන අනුව, මේ බඩු යවනු ඇත. ගිවිසුම සමගම ඇති වූ ලිපි ගනුදෙනුවකින් ප්‍රතිපත්තියක් වශයෙන් දෙරට අතර, නිත්‍ය නැව් සේවාවකට ද ඉඩ සලසා ඇත.

**1962 පෙබරවාරි 23 වැනිද** කොරියානු මහජන සමූහාණ්ඩුව සමග ''අන්‍යොන්‍ය වශයෙන් එකිනෙක ජාතියට උසස්ම සැලකිල්ල දක්වීමේ ක්‍රමය'' අනුව, දෙරට අතර වෙළෙඳ සබඳකම් දියුණු කර ගැනීම සඳහා ලිපි ලේඛන හුවමාරු කර ගනු ලැබීය. මේ ගිවිසුම අවුරුද්දකට වලංගු වන අතර, අනෙක් අවුරුද්දට නිරායාශයෙන් ම දීර්ඝ වීමට විධිවිධාන සලසා ඇත්තේය.

**1962 මැයි 16 වැනි ද**, 1957 අප්‍රේල් 23 වැනි දින ඉතාලි රජය සමග ගිවිස ගන්නා ලද වෙළෙඳ ගිවිසුමේ වලංගු කාලය තවත් වසරකින් දිගු කිරීම සඳහා ලිපි ලේඛන හුවමාරු කර ගනු ලැබීය.

**1962 සැප්තැම්බර් 22 වැනිද** 1959 සැප්තැම්බර් 25 වැනි දින බුරුම රජය සමග ඇතිකරගත් වෙළෙඳ ගිවිසුමේ විධිවිධාන වලට අනුව 1963 දී බුරුම සහල් ටොන් 2,25,000 ක් ගෙන්වා ගැනීමටත්, බුරුමයේ මනාපය පරිදි තවත් ටොන් 25,000 ක් එවීමටත් ගිවිස ගෙන බුරුම රජය සමග ලියුම් හුවමාරු කරගනු ලැබීය. එසේම වර්ෂය තුල බුරුමය ලංකාවෙන් මිලදී ගන්නා නිෂ්පාදිත ද වැඩි කිරීමට එකඟ විය.

**1962 ඔක්තෝබර් 3 වැනිද**, 1962 අවසානයට අවලංගු වී ගිය වෙළෙඳ ගිවිසුම වෙනුවට, චීන මහජන සමූහාණ්ඩුවත් සමග 1963 ජනවාරි 1 වැනි ද සිට අවුරුදු 5 කට වලංගු වන පරිදි වෙළෙඳ හා ගෙවීම් ගිවිසුමක් ගිවිස ගන්නා ලදී. මේ ගිවිසුමට අනුව හැම වසරකම ඔක්තෝබර් මස අවසාන වීමට පළමු ඊළඟ වසරේ හුවමාරු කර ගත යුතු භාණ්ඩ නියම කොට ගිවිසුම් ලේඛනයක් ඇතිකර ගත යුතුය. මෙදිනම අත්සන් කරන ලද 1963 සඳහා වූ ගිවිසුම් ලේඛනයෙන්, නියම වශයෙන්ම ලංකාවෙන් රුපියල් කෝටි 8·7 කට ආසන්න වටිනාකමට රබර් ටොන් 33,000 ක් ද, චීනයෙන් ඊට ආසන්න වටිනාකමට හාල් ටොන් 2,00,000 ක් ද, ඇතුළුව එක රටෙකින් රුපියල් කෝටි 11·0 කට ආසන්න වටිනාකමට බඩු හුවමාරුවට විධිවිධාන යොදන ලදී. මෙදිනම දෙරට අතර ආර්ථික හා කාර්මික සහයෝගතාවය සඳහා ගිවිසුමක් ද අත්සන් කරන ලදී. මේ අනුව 1963 ජනවාරි 1 වැනිදයින් පටන් ගෙන වර්ෂ පහක් තුළ දී රුපියල් කෝටි 5 ක් වටිනා ආර්ථික හා කාර්මික ආධාර චීනයෙන් ලබාගැනීමට සලස්වා ඇත. මේ ආධාර භාණ්ඩ වශයෙන් දෙනු ලැබේ.

**1962 දෙසැම්බර් 23 වැනිද**, ඉන්දියාවට සහ ලංකාවට 1963 දී විශේෂයෙන් අවශ්‍ය භාණ්ඩ වෙළෙඳාම පිළියෙළ කර ගැනීම සඳහා ලිපි ලේඛන හුවමාරු කර ගන්නා ලදී. මේ විධිවිධානවලට ''පසුව ගෙවන ක්‍රමය'' පදනම් කොට, රුපියල් කෝටි 5 ක වටිනාකමට දුම්රිය උපකරණ, ටැලිපෝන් උපකරණ සහ, ලංකාවට අවශ්‍ය විය හැකි යයි අනුමැතිය ලැබූ අනෙකුත් ප්‍රාග්ධන භාණ්ඩ, ඉන්දියාවෙන් ගෙන්වා ගැනීමේ විධිවිධාන ද ඇතුළත් විය.